# නව වසරක් උදා වේවා!

එළැඹෙන වසර සව් සිරියෙන් ඉතිරී
සමගිය සමාදානය දස දෙස පැතිරී
යුද ගිනි නිමා සාමයෙ මාවතෙ වැතිරී
මුළු ලොව දනට පතනවා නිති දිගාසිරී

ගත වූ වසර තුළ සිදු වූ වැරදි පමා
සොයා බලා පාඩමකට ගෙන ඒවා
යළි සිදු නොවන්නට ඒ දේ සිත රඳවා
නව වසරට යමු බාධක මග හරවා

දිය මත ඇඳි ඉරක් ලෙස දුක් දුරු වේවා
සිතන පතන හැම පැතුමන් ඉටු වේවා
රෝ දුක් සොර සතුරු පීඩා නැති වේවා
නිදුක් නිරෝගී සුව සෙත අත් වේවා

අවිදු අඳුර දුරු කර ලොව ජය ගන්න
ඉර සැදු මගේ ලොවටම එළියක් දෙන්න
කරුණා දයා මෙත් සිසිලෙන් සැනසෙන්න
පිවිතුරු චේතනා හද තුළ රජ වෙන්න

තිර අදිටන් බලය අවියක් කර ගන්න
බාධක ඉදිරියේ ගල් පව්වක් වන්න
සුදු නෙළුමක් වගේ හද නිර්මල වන්න
දියුණුව එයයි ඇප කැප වී දිරි ගන්න

දුප්පත්කම ලොවින් සදහට දුරු වේවා
වතුපිටි කුඹුරු ගහ කොළ සරු එල දේවා
ස්වභාවික විපත් අනතුරු නැති වේවා
සෞභාග්‍යයේ රන් දොරටුව බිහි වේවා

තෙරුවන් බෙලෙන් හැමටම ජය අත් වේවා
දහමට කැපව ජීවිත පැහැබර වේවා
කරුණා දයා මෙත් සිත හද ඉතිරේවා
යුක්තිය අයුක්තිය නිසි ලෙස විසඳේවා

කායික මානසික පීඩන නැති වේවා
සුබිත මුදිත ජනතාවක් බිහි වේවා
සත් පුරුෂයන් යන යන තැන හමු වේවා
ලැබූ නව වසර කිරි පැණියෙන් ඉතිරේවා

සෙනෙහෙලතා රත්නායක
ක්ලේටන්

## තාත්තා සහ හිම

(ජීවිතේ පළමු වතාවට හිම දැක්කෙ තාත්තගෙ උපන් දිනේ දවසෙ)

තාත්තා කියා දුන් කතාවක
හිම මිදී තිබුණා

රතු සොල්දාදුවෙක්
හිම මතින් දණ ගගා ඇදුණා
වෙඩි වැදුණ කකුලකින්
සුසුදු හිම කැටිති මත
රතු පාට මග ළකුණු ඇඳුණා
වේදනාවෙන් සැළෙන
තාත්තගෙ කටහඬට
පොඩි වුණත් මගේ හිත රිදුණා

හිම තැණුව සම බිමෙක
ඔහු සමඟ හිම කෙළින අතරතුර
ඉස්ට්‍රයික්කාර අපෙ තාත්තා
සයිබීරියාවට යැවූ කරදහිය තැපෑලෙන් ලැබුණා
මිටි මෙළවෙලා තිබුණ වම් අතේ නො තනියට
පොඩි අතක් පටැලවී තිබුණා

ස්ටෙප්ස් තැනිතලාවට වඩා දිග බඩගින්න
හිම වගේ හිතේ ගල් ගැසුණා
පොඩි හිතට දරන්න ම
බැරි වෙනා මොහොතකුත් තිබුණා
තාත්තගෙ හිම මිදුණ ඇස් අතර දහිරියට
හිම බෝලෙකට පයින් වැදුණා

ඒත් අපි හිම අතර රැඳුණා
අපෙ කකුල් දණ ළඟට එරුණා

බොයිලේරුවෙන් නැගුණු දුම් රොදක
සීනි නැති කහට සුව පිරුණා
කහට සුවඳින් ඇරුණ
කහට නැති ඇස් දෙකට
කවි ලියන මග ළකුණු පෙනුණා

ඉර්තු අතරින් බොහෝ දුර ඇවිද
ගණ නිලට කැරලි කෙහෙරැලි ගහණ
ඒ හිසේ හිම පියලි මිදුණා
ඒත් ඒ කටහඬේ පන්නරය දිළුණා
ඒ හඬින් කතාවක් ඇසුණා

කතාවේ හිම මිදී තිබුණා

මංජුල වෙඩිවර්ධන

## යාළුවන් ගේ දැනුම හරි මිළයි

කර කියා ගත නො හී
හිත නිඳද්දී වැතිරී
හැර දමා ගර්වය ආත්මාභිමානය
ඔබේ ගෙදරට පැමිණෙමි
සිඟමන් පිණිස ඥානය

නමයෙදී කවි බැරුව
අව්වෙ දණ ගහපුවා
මං කාටවත් කියන්නෑ
වට පිට බලා මගෙ
ඕ ලෙවල් පිටුවක් ම
උදුර ගත් එකත් අනෙ කියන්නෑ
මා යාළු මහත්තයෝ
පිනට ඔබෙ ඥානය
මිටක් මට දෙන්නකෝ

ගෙම්බෙක්වත් කැපුවේ නෑ ජීවක
ඌට වමනෙ එනවා එතකොට මතකද
බ්‍රහස්පතිට වැඩි ලොකු ඔළු-වක්
තිබුණේ තාරකයට
ලෝකෙ බෝලයක් බවවත්
දැනගෙන හිටියේ නැතුවට

ඒ උනාට උන්ට තිබුණ
මහ විසාල ප්‍රාර්ථනා
නමින් වාසගමින් ලැබුණ
ඒ නිසා ම උන්ගෙ
සමා-ගමයට මං ආස කළා
බැරි පාඩම් හෙමි හෙමිහිට
කියා දුන්න හිස අත ගා

ඉස්කෝලෙන් කට්ටි පැන-චිත්‍රපටි බලන්නට
පික් පොකට් ගහන කොට- මං උඹට බැන්නා
ගුරු සිත රිදවලා- වෙලාවත් වරදවා
දහමාට ගහද්දී- මං උඹ අල්ලලත් දුන්නා
අයි වෝන්ට් ටු බී කියලා
නිහඬ හිස්තැනක් තියලා
නුඹ ආපහු වාඩි වෙද්දි
අපි හයියෙන් හිනා වුණා

මං ඊයෙ ගියා ජීවකලහ
(ඊට කළින් තාරකලහ දහමයලහ
සමාවෙන්න දහම් මහත්තයලගෙ අහ)
උන් උන්නේ අඩි ගාණක් උඩ පොළොවෙන්
මං ඉල්ලුවාම ගන්න කිව්ව
ඒත් හරිම මිළයි එව්ව- මං ආපහු ආවා

මට මතකයි ධනය ගෙනැත්
අගේ කෙරුව හැටි පේන්න
රම්බෝගේ ස්ටිකරය
පස්සෙන්දා නුඹ ගෙනැවිත්
ස්ටිකර් ම ලොකු කොළයක්
පංතියට ම බෙදුවා

ඊට පස්සෙ ගුටි කෑවා ලොකු සර්ගෙන්
පදික වෙළෙන්දා ඇවිදින් පැමිණිලි කරලා
උගෙ ඔළුවත් පැළිලා

මං ඉදිරියෙ මේ ඉන්නේ
ඒ රම්බො ම වෙන්නට ඇති
බය වෙයන් කියල කිව්වත් මං
බය වෙන්නේ නැති

කට්ට අව්වෙ කෑ ගහලා
කට්ට මුසා වැකි අහලා
කට්ට කාල කට්ට කාල
රජ මැති ඇමතිල එක්කත්
ඔට්ටු වෙලා ඇති මං

කළු ගල් ගෙඩි වගෙ මස් ගොබ
දම්වැල සුදු යකඩ මහත
පපුව පුරා මකරාක්ෂ
බය කළාට කියන්න මං
බය වෙන්නේ නැති

බය නැතුවයි මං ආවේ
ලැජ්ජා නැතුවයි ආවේ
පිනට යමක් ඉල්ලන්නයි
නැවිත් බැරි තැන ආවේ

ගැමුණු පී. දසනායක

## හිම කිරිල්ලී

හිම පාට
කිරිල්ලිය...
මහ රෑක
නිදි බින්ද..
රකුසෙකුගෙ
රතු පාට
ඇස් දෙකක...

කුලූඳුලේ
බිම වැටෙන
හිමකැටය...
රැඳේවිද
කළු පියාපතක්
මත..?

කඩුපුලක්
පිපේවිද
මැදියමක..?
හිනාවෙන්නට
නොදත්
ගල්කුළක..

සාවියක්
කොයි ලෙසක
සැතපෙයිද...
වළ ගොඩැලි
පිරුණ කල
සඳවතක

සිනා සී
ගලා යන කල
ගඟට...
ඇහුණාද
පෙණ පොදක
ඉකිබිඳුම..?

හිම පාට
කිරිල්ලිය...
මහ රෑක
සැඟව ගිය..
රකුසෙකුගෙ
රතු ඇසක
බැල්මකට..

රසික
ජයකොඩි

## සමුගැන්ම

වියරු සිනහා අතරින් පතර
ඇසේ හුරුපුරුදු තෙපුල් හඬ
ඒ මා අකුරු කළ බසමද?
ලදත් කෙතරම් අගැයුම් කැටිකර
මට අවැසි නැත එවන් මව් බස

දන්නාඳුනන තැනිතලාවකි
ලේ ගලායන රුදු වධක බිම
ඒ මා උපන් මහ පොළොවම ද?
කොයිතරම් දෙව් බඹුන් රැකි මුත්
දෙපා නොරඳම් එවන් මව් බිම

උමතුවෙන් වුව අවි අතැති නුඹ
එකම පැහැයෙනි පුරුදු හැඩරුව
එකම දැයකට අපි අයිති වෙද?
කොයිතරම් බුහුමන් ලැබූවද
යලිදු නොපතමි එවන් ජාතිය

දැකලා පුරුදු ඔය මුහුණුවර
වැනිය එක මවෙක කුස ඉපැදුන
සෝයුරාම ද එකටම වැඩුණු?
කොයිතරම් සෙනෙහස දැරූව ද
කඩා බිඳ ලමි සහෝදරකම

වෙඩි තබා හිසෙන් හිසට සැහැසිව
ගොඩනැගේවි ද සාමයේ පුද බිම
නුඹ දොරින් දොර ගැවසෙන විට?
කොයිතරම් සංසුන් වුවත් නගරය
පලා යමි මොහොතකට වත් නොඉඳ

උරා ගනිමි ගලායන උණුසුම් රතු ලෙය
වෙලා ගනිමි ඉගිල්ලුණ අවසන් සුසුම
බදා ගනිමි නුඹලා පවසන වැරැද්ද ද
නොකල් හී ඔවුනට මියෙන්න ට සිද්ධවුණ

අතැර මට උරුම සියල්ල ම

මහේෂ් මුණසිංහ

# පහන් වැට

## මවුනි මගේ

නැතිය වෙන සෙනෙහසක්
මිහිපිටම ඔය තරම්
නුඹයි මට දිරි දුන්නේ
පිය නගන්නට වරම්
දුක් වින්ද ඔබ අම්මේ
සියළු බර කර දරන්
ඉඩක් තව තිබුණිදෝ
උහුලන්න ඔය තරම්..

අනේ මගෙ බුදු අම්මේ
දෙනවද මට ටිකක්
දරා ගත් දුක් බිඳක්
සංසාරය පුරා
උහුලන්න නම් එපා
එතෙර වනු මැනේ
සසර සයුරෙන් හවේ..

දොහොත් මුදුනින් වඳින්නේ මේ
සෑම දිනකම ඔබෙ දෙපා
ජීවය මගෙ ඔබයි අම්මේ
සරණ  වෙන මට කොයින්දෝ
තුන් සරණේ බල මහිමයෙන්
දිනෙන් දිනකම සුව ලැබේවා
පතන්නේ මා හද පුරා

නිල්මිණී ප්‍රියදර්ශනී
ජර්මනිය

## රන් දෙවොල

දෙවියන් වෙසෙනා දෙව්ලොව
මට පෙම් කරනා නුඹෙ දෙවොලයි
හිනි පෙත්තට නැග දෙව්ලොව දැක ගන්නට
පියගැට පෙළ වූයේ නුඹයි මට
    මගේ දෙව්ලොව පහන් නිවා
    ගැල් වූ සුවඳ සුළඟේ පා කර ඇත
    රිදී සීනු හඬ නෑසුනි මට
    දෙවියනේ මගේ දෙවොලට
    කවදා ආයේ වඩිනුදෝ නුඹ
චපල වූ මගේ දෙවොලට
දෙවියන් ;න් දඬුවම හොඳටම ඇති
දෙවියන් වඩිනු මැන මා දෙවොලට
චපල නොවෙමි මම මින් මතුවට
    දෙවියන් සේ පුදමී මම නුඹ
    දෙවැනි මවක් වූ නුඹගේ
    දයාබර සෙනේහයෙන් පිරුනු දෙවොල
පමණයි මිහිපිට ඇති
දෙවියන් හිඳිනා රන් දෙවොල
පහන් නොනිවමී දොරගුල් නොවසමී
වැජබෙනු සදහට මගේ දෙවොලේ ඔබ

සුජීවා ප්‍රියදරඬශනි
ඉලංගන්තිලක